71744

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:- ............................................................ විභාග අංකය:- ............................................................

● අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

## I කොටස

01. යසෝදරා දේවියගේ පියා වන්නේ,
 1 සුද්ධෝදන රජු ය. 2 සුප්‍රබුද්ධ රජු ය.
 3 බිම්බිසාර රජු ය. 4 අමිතෝදන රජු ය.

02. සතර පෙර නිමිති දුටු සිදුහත් කුමරුගේ සිතට යම් පැහැදීමක් ඇති වූයේ,
 1. මහල්ලෙකු දැකීමෙනි. 2. ලෙඩකු දැකීමෙනි.
 3. මළ සිරුරක් දැකීමෙනි. 4. පැවිදි රුවක් දැකීමෙනි.

03. බෝධීන් වහන්සේ වන්දනා කරන ගාථාවේ මුල් පාඨය වන්නේ,
 1. යස්ස මූලේ නිසින්නෝව ..... යන පාඨයයි. 2. සද්ධාය සම්පදිත්තේන ..... යන පාඨයයි.
 3. වන්දාමි චේතියං සබ්බං ..... යන පාඨයයි. 4. සුගන්ධං සීතලං කප්පං ..... යන පාඨයයි.

04. උදෑසන අවදි වී වැලි දෝතක් උඩ දමා "මේ වැලිකැට ප්‍රමාණයට මට ගුරුවරුන්ගේ අවවාද ලැබේවා" යන ප්‍රාර්ථනාව සිදු කරන ලද්දේ,
 1. නන්ද හිමියන් විසිනි. 2. සුභද්‍ර හිමියන් විසිනි.
 3. රාහුල හිමියන් විසිනි 4. ආනන්ද හිමියන් විසිනි.

05. බුදුරජාණන් වහන්සේ දියුණුව සඳහා උපකාරී වන කරුණු 6ක් "අත්ථස්සද්වාර ජාතකයේ" පෙන්වා දී ඇත. එයින් "අලීනතා" යනුවෙන් අදහස් කරන්නේ
 1. දැහැමි ව ජීවත්වීමයි. 2. කම්මැලි නොවීමයි.
 3. ශීලාචාරකමයි. 4. හොඳින් ඉගෙන ගෙන තිබීමයි.

06. තමා විසින් ම වැරදි කිරීමත්, අන්‍යයින් ලවා කරවීම, අන්‍යයන් විසින් කරන වැරදි අනුමත කිරීම හා ඒවාට අනුබල දීමත් යන කරුණුවලින් වැළකී කටයුතු කිරීම අයත් වන්නේ,
 1. ආජීව අෂ්ටමක ශීලයටයි. 2. පන්සිල්වලටයි.
 2. පැවිදි ශීලයටයි. 5. ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලයටයි.

07. කෙනෙකුගේ දියුණුවට ඊර්ෂ්‍යා නොකර සතුටු වීම උසස් මානුෂික ගුණාංගයකි. එම ගුණාංගය බුදු දහමේ හඳුන්වා ඇත්තේ,
 1. මෙත්තා නමිනි. 2. කරුණා නමිනි.
 3. මුදිතා නමිනි. 4. උපේක්ඛා නමිනි.

08. බුදුදහමේ හැඳින්වෙන අනිත්‍යතාව යනුවෙන් අදහස් වන්නේ,
1. සියලු දෙයක ම ඇති වන වෙනස්වීමයි.
2. සියලු දෙයක ම ඇති නො වෙනස් බවයි.
3. සියලු දෙය ම තමාට අයිති නැති බවයි.
4. තමාට මුහුණ පෑමට සිදුවන දුක්ඛදායක තත්ත්වයයි.

09. තමා ගැන සිතා අන් අයට අවැඩ පිණිස හේතුවන ක්‍රියාවන්ගෙන් වැළකී වැඩ පිණිස හේතුවන ක්‍රියාවන්හි නිරතවීම බුදුදහමේ හැඳින්වෙන්නේ,
1. අත්තාධිපති ශීලය නමිනි.
2. ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලය නමිනි.
3. අත්තූපනායික ධර්ම පර්යාය නමිනි.
4. ලෝකාධිපති ශීලය නමිනි.

10. බුද්ධ ශාසනයේ පැවිද්ද ලැබූ මුල් ම ශ්‍රී ලාංකිකයා ලෙස ඉතිහාසගත වන්නේ,
1. භණ්ඩුක උපාසකයා ය.
2. අරිට්ඨ කුමාරයා ය.
3. රාහුල කුමාරයා ය.
4. නන්ද කුමාරයා ය.

11. ලංකාවට බුදුදහම ලැබීමෙන් අනතුරු ව ඉදි වූ ප්‍රථම ස්තූපය වන්නේ,
1. ථූපාරාම චෛත්‍යය යි.
2. රුවන්වැලි චෛත්‍යය යි.
3. කැලණි චෛත්‍යය යි.
4. මිරිසවැටිය චෛත්‍යය යි.

12. ස්වර්ණ හංස ජාතක කතාවෙන් සමාජයට දෙන ප්‍රධාන පණිවුඩය වන්නේ,
1. අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය යුතු බවයි.
2. ඉවසීමෙන් සැනසීම ලැබෙන බවයි.
3. අන් අය තලා පෙළා කටයුතු නොකළ යුතු බවයි.
4. දැඩි ලෝභය දුකට පත්වීමට හේතුවන බවයි.

13. මඝ මානවක තරුණයාගේ චරිතයෙන් ප්‍රකට වන ආදර්ශයක් වන්නේ,
1. ගිලනුන්ට උපස්ථාන කිරීමයි.
2. දෙමව්පියන්ට සැලකීමයි.
3. වගකීම හා වගවීමයි.
4. තමාට නුසුදුසු සභාවක් මැද නිශ්ශබ්ද ව සිටීමයි.

14. බෞද්ධයන් වන අපි සෑම විට ම පූජනීය ස්ථානවල දී ශාසනික වචන භාවිත කරන්නෙමු. ඉන් "පැන් පහසු වෙනවා" යන්නෙන් අදහස් වන්නේ
1. "පහසුවෙන් පැන් ගෙනෙනවා" යන්නයි.
2. "දිය නානවා" යන්නයි.
3. "පැන් වළඳනවා" යන්නයි.
4. "පැන් ඉසිනවා" යන්නයි.

15. සංඝමිත්තා තෙරණිය ඇතුළු භික්ෂුණීන් වහන්සේලාට වැඩ සිටීමට "හත්ථාලක මෙහෙණවර" නම් ආරාමය පූජා කරන ලද්දේ,
1. දේවානම්පියතිස්ස රජු විසිනි.
2. මහා පරාක්‍රමබාහු රජු විසිනි.
3. වළගම්බා රජු විසිනි.
4. මහසෙන් රජු විසිනි.

16. බුදුරජාණන් වහන්සේ කැඩපතක් උදාහරණයට ගෙන පුංචි රාහුල හාමුදුරුවන්ට හොඳ නරක පිළිබඳ පැහැදිලි කර දුන් සූත්‍ර ධර්මය වන්නේ,
1. සිගාලෝවාද සූත්‍රයයි.
2. කරණීය මෙත්ත සූත්‍රයයි.
3. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයයි.
4. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.

17. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා කම්මන්ත යනු,
   1. තම කර්මාන්ත ආරක්ෂා කර ගැනීමයි.
   2. යහපත් වූ ක්‍රියාවන්හි නිරත වීමයි.
   3. සිල්වත් වීමයි.
   4. යහපත් දිවිපැවැත්මයි.

18. ඉවසීමෙන් තොර ව දියුණු විය නොහැකි ය. දිනපතා පාසලෙන් දහම් පාසලෙන්, පොතපත කියවීමෙන්, බණ ඇසීම ආදියෙන් අපි දැනුම ලබා ගනිමු. එය බුදු දහමේ දක්වා ඇත්තේ,
   1. "වුද්ධානුමතං" ලෙසයි.
   2. "ධම්මානුවත්ති" ලෙස යි.
   3. "සීලං" ලෙසයි.
   4. "සුතං" ලෙසයි.

19. වප්මගුල් උත්සවයේ දී සිදුහත් කුමරු පලක් බැඳ ආනාපානසති භාවනාව කළ අවස්ථාවේ දී සුද්ධෝදන රජතුමා විසින් කුමරුට වඳින ලදී. එය සුද්ධෝදන රජු කුමරුට වඳින ලද,
   1. පළමු වැඳීමයි.
   2. දෙවන වැඳීමයි.
   3. තෙවන වැඳීමයි.
   4. සිවුවන වැඳීමයි.

20. බෝසතාණන් වහන්සේ උපදවා ගත් "පුබ්බේනිවාසානුස්සති ඤාණය" යනු,
   1. ගැටළු නිරාකරණය කිරීමේ නුවණයි.
   2. සියලු කෙලෙස් නැසීමේ නුවණයි.
   3. පෙර අත්බව සිහි කරන නුවණයි.
   4. සත්ත්වයන්ගේ උත්පත්තිය හා මරණය සිදුවන ආකාරය දැකීමේ නුවණයි.

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. තුන්වන වාරයේ දී ඔබ විසින් පන්ති කාමරයේ දී සකස් කරන ලද බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
   (i) බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා ඔබ යොදා ගත් පාඩම කුමක් ද?
   (ii) බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ඔබේ ගුරුතුමා/ගුරුතුමිය නම් කළ කණ්ඩායම් මොනවා ද?
   (iii) එහිදී කරුණු දැක්වීමට ඔබේ කණ්ඩායමට පවරන ලද මාතෘකාව කුමක් ද?
   (iv) බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා ඔබේ ගුරුතුමා/ගුරුතුමිය ඔබට දුන් උපදෙස් 2ක් ලියන්න.
   (v) බිත්ති පුවත්පත සකස් කිරීමේ දී ඔබට මුහුණ පෑමට සිදු වූ ගැටළු 2ක් ලියන්න.
   (vi) එම ගැටළු අවම කර ගැනීම සඳහා ඔබ කණ්ඩායම ගත් පියවර 2ක් ලියන්න.
   (vii) පාසලේ දී සම්පත් පරිහරණය සඳහා ඔබ විසින් සැමදා ඉටු කරනු ලබන කාර්යයන් 2ක් ලියන්න.
   (viii) සම්පත් පරිහරණය කිරීම සම්බන්ධ ව ආදර්ශ පාඨ 2ක් ලියන්න.
   (ix) බිත්ති පුවත්පත් වැනි නිර්මාණ කිරීමෙන් ඔබට ඇති ප්‍රයෝජන 2ක් ලියන්න.
   (x) බිත්ති පුවත්පත සකස් කිරීම නිසා ඔබ ලැබූ අත්දැකීම් 2ක් ලියන්න.

(ලකුණු 2 X 10 = 20)

02. (i) සිදුහත් බෝසත් කුමරා මෙලොව එළිය දුටුවේ කුමන පොහෝ දිනක ද? (ල. 02)
   (ii) සිදුහත් බෝසතාණන් වහන්සේගේ මවගේ, සුළු මවගේ, සහ පියාගේ නම් පිළිවෙළින් ලියන්න. (ල. 03)
   (iii) සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපතේ සිට මහාභිනිෂ්ක්‍රමණය දක්වා සිදු වූ වැදගත් සිදුවීම් අතුරින් 5ක් ලියන්න. (ල. 05)

03. (i) සීල, සමාධි, ප්‍රඥා යන ධර්ම කරුණු 3 හැඳින්වෙන නම කුමක් ද? (ල. 02)

(ii) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීලයට අයත් අංග 3 ලියන්න. (ල. 03)

(iii) සිල්වත් දරුවකු වීම සඳහා ඔබ නොකළ යුතු දේවල් 5ක් ලියන්න. (ල. 05)

04. (i) ජාතික කොඩියෙහි අඩංගු සංකේත 4ක් ලියන්න. (ල. 02)

(ii) එම සංකේත හතරෙන් තුනක අර්ථ ලියා දක්වන්න. (ල. 03)

(iii) ජාතික කොඩිය භාවිතයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු අතරින් 5ක් ලියන්න. (ල. 05)

05. (i) තංච කම්මං කතං සාධු

යං කත්වා නානුතප්පති

..............................................

..............................................

ඉහත ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 02)

(ii) එහි සරල තේරුම ලියන්න. (ල. 03)

(iii) ඔබ සිදු කොට ඇති නැවත නැවත සිදු කරමින් සතුටු විය හැකි කටයුතු 5ක් ලියන්න. (ල. 05)

06. (i) සෑම වසරක ම ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ කවර දිනක ද? (ල. 02)

(ii) පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන 03ක් ලියන්න. (ල. 03)

(iii) පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 5ක් ලියන්න. (ල. 05)

07. (i) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරවන ලද්දේ කිනම් පොහෝ දිනක ද? (ල. 02)

(ii) එසේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම හඳුන්වන නම් 2ක් ලියන්න. (ල 03)

(iii) ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම නිසා රට තුළ ඇති වූ ආගමික හා සාමාජික වෙනස්කම් 5ක් ලියන්න. (ල. 05)